www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මැක්ලෙලන්ගේ කෘතියෙහි ආදීනව: එකල හා මෙකල ඉරාක යුද්ධයට හවුල්වන අනුබල දෙන්නෝ

## Fallout from McClellan book: The Iraq war's "complicit enablers," then and now

**බිල් වෑන් ඕකන් විසිනි**
**2008 මැයි 30**

ඉරාකයෙහි "අනවශ්‍ය යුද්ධයකට" එක්සත් ජනපදය ඇදගෙන යෑමට "දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරයක්" හා මුලාකිරීම උපයෝගී කර ගැනීම සම්බන්ධයෙන් කලින් ධවල මන්දිරයේ ප්‍රවෘත්ති ලේකම් තනතුර දැරූ ස්කොට් මැක්ලෙලන්ගේ නව කෘතියෙන් බුෂ් පාලන තන්ත්‍රයට චෝදනා කෙරේ. එය දක්ෂිනාංශික රිපබ්ලිකන් පක්ෂයෙන් දැඩි දෝෂාරෝපන රැල්ලක් මුදාහැරීමට හේතුවී ඇති අතර සිය දේශපාලන අරමුන ඉටු කර ගැනීම සඳහා සියල්ල හෙලි කරන මෙම වාර්තා සටහන ප්‍රයෝජනයට ගැනීමට අවස්ථාවාදී ප්‍රයත්නයක් දැරීමට ඩිමොක්‍රැටික් පාක්ෂිකයන් පොලඹවා ඇත.

මැක්ලෙලන් සිය රූපවාහිනී ප්‍රවෘත්ති සම්මුඛ සාකච්ඡා වට අරඹත්ම, කලින් ධවල මන්දිරයේ උපදේශක තනතුර හෙබවූ ඩෑන් බාට්ලට් "සිදු වූයේ කුමක් ද: බුෂ් ධවල මන්දිරයෙහි හා වොෂින්ටනයෙහි මුලාකිරීමේ සංස්කෘතිය පිලිබඳ ඇතුලාන්තය" යන මෙම කෘතිය "මුලුමනින්ම ප්‍රලාප" ලෙස හැඳින්වීය. හිටපු ප්‍රවෘත්ති ලේකම්ගේ ක්‍රියාකාරකම් "සම්මත හැසිරීම් සීමාවන්ගෙන් පිටස්තර ඒවා" බව ද ඔහු ප්‍රකාශ කලේ ය. මැක්ලෙලන් "ආත්මාර්ථකාමී, අවංකකමින් තොර වූ හා වෘත්තීමය ප්‍රමිතියකට නොසරිලන සේ කටයුතු කරන" පුද්ගලයෙකු යයි හිටපු ධවල මන්දිර ත්‍රස්ත විරෝධී සහායක ෆ්‍රාන්සස් ටවුන්සෙන්ඩ් සීඑන්එන් රූපවාහිනී චැනලයට කියා සිටියේ ය.

මේ අතරවාරයේ බැරැක් ඔබාමා හා හිලරි ක්ලින්ටන් යන සෙනෙට් සභිකයින් දෙදෙනාම සිය ඩිමොක්‍රැටික් පාක්ෂික ජනාධිපති ව්‍යාපාර සඳහා මැක්ලෙලන්ගේ කෘතිය උපයෝගි කර ගත්හ.

ක්ලින්ටන් මැක්ලෙලන් වීරයෙකු සේ සැලකීය. "වසර තුනක් පුරා ඇමරිකාව නොමග යැවීමේ කොටස්කරුවෙකු වීම ගැන මේ තරුනයා මූලිකව සමාව අයැද සිටී. අපගේ ජනාධිපති හා ඔහු සමග සමීපව සේවය කල අයවලුන් ඇමරිකානු ජනතාව සමග සම මට්ටමක නොසිටීම හෝ අවශ්‍යවූ අවස්ථාවල මග වෙනස් නොකිරීම කෙතරම් අසීරු තත්වයක් වී දැයි යන්න ගැන ඔහු කියා සිටී"යයි ක්ලින්ටන් ප්‍රකාශ කලාය.

ඉරාකය ආක්‍රමනය කිරීම සම්බන්ධයෙන් බුෂ්ට හිතුමනාපයේ කටයුතු කිරීමට ඡන්දය දුන් සෙනෙට් සභාවේ ඩිමොක්‍රැටික් පාක්ෂිකයින් බහුතරයෙන් කෙනෙකි. ක්ලින්ටන් විද්‍යමාන වන පරිදි ඉරාක යුද්ධය ඇරඹීමට ආසන්න කාලයේ මෙම සිදුවීමට අදාලව විෂය වෙනස් කිරීමට අවශ්‍යවූ ක්ලින්ටන් තව දුරටත් මෙසේ කීය: "ජනාධිපති බුෂ් අප නොමග යැවූ බවට සැකයක් තිබිය නොහැක. දැන් ප්‍රශ්නය වන්නේ ඉදිරියට යෑම සඳහා කුමන ආකාරයේ ජනාධිපතිවරයෙකු අපට අවශ්‍යවන්නේ ද යන්න ය."

ඩිමොක්‍රැටික් පක්ෂය තුල තරගයෙන් ඉදිරියෙන් සිටින බැරැක් ඔබාමාට ඉරාකය සම්බන්ධයෙන් අත්දැකීම් නොමැති බවට රිපබ්ලිකන් පක්ෂයේ අපේක්ෂක සෙනෙට් සභික ජෝන් මැකේන් කල චෝදනාවට එරෙහිව කරුනු දැක්වීමට ඔබාමාගේ මැතිවරන ව්‍යාපාරය විසින් නිකුත් කරන ලද ප්‍රකාශයකින් මෙසේ කියැවිනි: "අප යුද්ධය කරා ගෙනයෑමට බුෂ් පාලන තන්ත්‍රය මුලා කිරීම හා ප්‍රචාරය යොදාගත් බවට හිටපු ප්‍රවෘත්ති ලේකම් පිලිගැනීමෙන් පසු දින යුද්ධය වෙනුවෙන් එම පලුදු වූ තර්කය ඉතා පහසුවෙන් පිලිගත් සෙනෙට් සභික මැකේන් ඉරාකය පිලිබඳ අවබෝධයේ ගැඹුර ගැන අන් අයට දේශනා කිරීම අපූර්ව සිදුවීමක් සේ පෙනීයයි."

මිලියනයකට අධික ගනනක් ජීවිත අහිමිවූවා වූ ද දස දහස් ගනන් එක්සත් ජනපද හටකායන් මරනයට පත්වූවාවූ හෝ තුවාල ලැබූවා වූ ද යුද්ධයක් දියත් කලේ "මුලා කිරීම හා ප්‍රචාරය" තුලින් යයි ධවල මන්දිරය තුලින්ම තහවුරු වීම සම්බන්ධයෙන් විස්මයජනක ගම්‍යයන් එලියට ගැනීමට කිසිදු ප්‍රයත්නයක් නොදරන ලදි. එය හුදෙක්ම උපයෝගී කර ගන්නා ලද්දේ බැරැක් ඔබාමා සිය රිපබ්ලිකන් පාක්ෂික ප්‍රතිමල්ලවයාට වඩා සුදුසු අපේක්ෂකයකු බව ඉස්මතු කිරීම සඳහා මාතෘකාවක් ලෙස ය.

මැක්ලෙලන්, නියෝජිත මන්ත්‍රී මන්ඩලයේ අධිකරන කමිටුව ඉදිරියේ දිවුරා සාක්ෂි දිය යුතු බවට එක් ඩිමොක්‍රැටික් පාක්ෂික කොන්ග්‍රස් සභිකයෙකු වූ ෆ්ලොරිඩාව නියෝජනය කරන රොබට් වෙක්ස්ලර්

ඉල්ලා සිටියේ ය. සීඅයිඒ ක්‍රියාකරු වැලරි ෂෙල්ම් විල්සන්ගේ අනන්‍යතාව හෙලිකිරීම පිලිබඳ හිටපු ජනාධිපති ප්‍රකාශකගේ කෘතියේ සඳහන් කොටසටත් යුක්තිය ඉටුකිරීමට බාධා කෙරෙන කුමන්ත්‍රනයකට කාල් රෝව්, ලුවිස් ස්කූටර් ලිපි හා උප ජනාධිපති ඩික් චේනි සහභාගිවීම පිලිබඳ ඇඟවීමටත් ඔහු අවධානය යොමු කලේ ය.

මැක්ලෙලන්ගේ කෘතියෙහි ඇතුලත් ප්‍රකාශ, චේනිට එරෙහිව දෝෂාභියෝග ක්‍රියාවලියක යෙදීම සාධාරනීකරනය කරන බවට තම සහායකයින් වෙත යවන ලද ලිපියකින් වෙක්ස්ලර් කියා සිටියේ ය. එසේ වුවද පාලන තන්ත්‍රය තුල පූර්න අපරාධකාරීත්වය පිලිබඳව දිගින් දිගටම කෙරෙන හෙලිදරව් කිරීම්, " දෝෂාභියෝග ක්‍රියාවලියක යෙදීමට සහායවීමට ලිබරල්වාදී හා ප්‍රගතිශීලී කොන්ග්‍රස් සාමාජිකයින්ගෙන් බහුතරයකට පවා ඒත්තු ගැන්වීමට ප්‍රමානවත් නොවන බව ඔහු ඉක්මනින්ම පිලිගත්තේ ය. මෙයට අමතරව, දෝෂාභියෝග ක්‍රියාවලියක යෙදීම අපගේ කොංග්‍රසය තුල න්‍යාය පත්‍රයන් නොවැම්බර් මස මැතිවරනයෙන් ලැබියහැකි වාසිත් අනතුරට ලක් කරනු ඇතැයි කොංග්‍රසය තුල ඩිමොක්‍රැටික් පක්ෂයේ නායකත්වයට සැබැවින් හැඟේ."

වෙනත් වචනවලින් කියතොත්, "නිල රැස්වීම්වලින් පිටස්තරව," දෝෂාභියෝග ක්‍රියාවලියක යෙදිය යුතු යයි යලි යලිත් ප්‍රකාශ කර සිටි ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වය, මැක්ලෙලන්ගේ ශාපලත් සාක්ෂිය පිලිබඳව, බාල දේශපාලන වාසි කිහිපයකට උපයෝගී කර ගැනීම හැර, කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට අපේක්ෂා නොකරයි. සාපරාධී ආක්‍රමනශීලී යුද්ධයකට වගකිවයුතු අය පසුපස හඹායෑමේ තර්කානුකූල ක්‍රියාමාර්ගය එයට අනුගමනය කල නොහැක. මන්දයත්, ඩිමොක්‍රැටික් පාක්ෂිකයන්ම මෙයට පූර්න වශයෙන් හවුල්වී ඇති නිසා ය. ඊයේ දින නියෝජිත මන්ත්‍රී මන්ඩලයෙහි කථානායිකා, පෙලෝසි, පිලිගත් පරිදි, අමූලික බොරු මත පදනම්වූ යුද්ධයක් තව දුරටත් කරගෙන යෑම සඳහා සත්තකින්ම, නියෝජිත මන්ත්‍රී මන්ඩලයෙහි හා සෙනෙට් සභාවෙහි පක්ෂයේ නායකත්වය දැනටමත් ඩොලර් බිලියන 165ක් අනුමත කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

යුද්ධය වෙනුවෙන් ව්‍යාජ ප්‍රචාර තුලින් පෝෂනය කල අයට මැක්ලෙලන් චෝදනා කලේ ය. ඇතැම්විට වඩාත්ම හෙලිදරව්වුනු ප්‍රතික්‍රියාව වූයේ මැක්ලෙලන්ගේ චෝදනාවලට මාධ්‍ය විසින් දක්වන ලද ප්‍රතික්‍රියාවයි. ඇමරිකානු ජනතාව හිතාමතාම මුලාකිරීමෙහි ලා බුෂ් පාලන තන්ත්‍රයට සිය කැමැත්තෙන් එක් වූ සහායකයෙකු ලෙස ඔහු මූලිකව මාධ්‍යයට චෝදනා කලේය.

"තමා වොෂින්ටනයෙහි ගත කල වසර ගනනාව තුල ජාතිය මුහුන දුන් ඉතාමත් වැදගත් තීරනය සම්බන්ධයෙන්, එනම්, ඉරාකය සමග යුද්ධයට යා යුතු ද නැද්ද යන්න අතර තෝරා ගැනීම සම්බන්ධයෙන්, පුවත්පත්, ධවලමන්දිරය හා පාලන තන්ත්‍රය කෙරේ වඩාත් ගරු සැලකිලි පාන ස්වභාවයකින් හැසුරුනු බවට" මැක්ලෙලන් සිය කෘතියෙහි චෝදනා කරයි. යුද්ධය දියත් කිරීමට පාලන තන්ත්‍රය විසින් යොදා ගත් ව්‍යාජයන් අවමානයට ලක් වීම "කිසි වටෙක පුදුමයට හේතුවන කරුනක් නොවේ ය"යි ඔහු කියා සිටියේ ය. මින් හැඟීයන්නේ තමන් ව්‍යාජ ප්‍රචාර වැමැරූ බව ජනමාධ්‍ය හොඳින් දැන සිටිය ද දර්ශන බලන හෝ පුවත්පත් කියවන අයට ඒ පිලිබඳව කිසිවක් නොකී බවය.

"ලිබරල්වාදී ජනමාධ්‍ය සිය කීර්තියට සරිලන සේ ක්‍රියාකලේ නැත." ඔවුන් සම්බන්ධයෙන් වඩාත්ම ශාප කරන නිවැරදිම සඳහන වූයේ ඔවුන් බුෂ්ගේ යුද මෙහෙයුමට "හවුල් වී අනුබල දුන් අය" ලෙස හැඳින්වීම ය. මෙයට ප්‍රතිචාර වශයෙන් මැක්ලෙලන්ගේ චෝදනාවල සත්‍යතාවක් ඇතැයි ජනමාධ්‍යවල ඇතැම් සාමාජිකයෝ අර්ධ වශයෙන් පිලිගත්හ. සීඑන්එන් වාර්තාකරු ජෙසිකා යෙලින් බදාදා රාත්‍රියෙහි කේබල් ප්‍රවෘත්ති ජාලයක පෙනී සිටිමින්, ප්‍රවෘත්ති විධායක නිලධාරින් - ඇය සඳහන් කලේ 2003 වසරෙහි ඇය සේවය කල එම්එස්එස්බීසී ආයතනය ගැන බව පසුව ඇය පැහැදිලි කලාය - "ජනාධිපති සම්බන්ධයෙන් ධනාත්මක වෘත්තාන්ත ඉදිරිපත් කරන ලෙස "ඇයට සහ අනිකුත් අයට පීඩනයක් එල්ල කල බවය. මගේ වෘත්තාන්ත ඔවුහු සංස්කරනය කලහ... ඔවුහු වඩාත් විවේචනාත්මක වෘතාන්ත ප්‍රතික්ෂේප කලහ"යි ඇය තව දුරටත් කීවාය.

"පුවත්පත් බලඇනිය සංස්ථාමය විධායක නිලධාරින්ගේ දැවැන්ත පීඩනයට ලක්විය. විවෘතව කියතහොත් එම පීඩනය එල්ල කලේ යුද්ධය පිලිබඳ චිත්‍රය ඉදිරිපත් කෙරුනේ ජාතිය තුල දේශානුරාගී උද්වේගය හා ජනාධිපතිට අනුමැතිය දීමේ දී ලැබුනු ඉහල අගැයීම් හා සංගත වන ආකාරයට යයි සහතික කිරීමට ය"යි යෙලින් පැහැදිලි කලේ ය.

බදාදා පැවැත්වෙන "අද දින" හෙවත් "ටුඩේ" වැඩසටහනට පෙනී සිටි එන්බීසී ආයතනයේ බ්‍රයන් විලියම්ස්, සීබීඑස් ආයතනයෙහි කේටි කූරික් හා ඒබීසී ආයතනයේ චාලි ගිබ්සන් යන ප්‍රවෘත්ති සංවිධායකයින් තිදෙනාගෙන් මැක්ලෙලන් ජනමාධ්‍යයට එල්ල කරන ලද චෝදනා සම්බන්ධයෙන් සිය අදහස් දක්වන ලෙස ඉල්ලා සිටින ලදී.

හිටපු ප්‍රවෘත්ති ලේකම්ගේ තක්සේරුව "සෑහෙන දුරකට නිවැරදි ය"යි කූරික් පිලිගත්තාය. "9/11 හි භාවාර්ථය සැලකිල්ලට ගත් කල ජනතාව එක්සත්ව සසලව, කෝපයෙන් හා ඉච්ඡාභංගත්වයෙන් පසුවුනි. ඒ පසුබිම තුල මේ ප්‍රවෘත්තිය ආවරනය කරන

විට, ඇතැම් නිවැරදි ප්‍රශ්න ඇසීමට අප අතින් අතපසුවූ බව මම සිතමි."" යුද්ධය කරා කෙතරම් සැලකිය යුතු පෙලගැස්මක් තිබුනි ද යත් ආරම්භයේදීමත්, යුද්ධය පෙරට ඇදී යාමත් සමග, එය ප්‍රශ්න කල යුතු අය දේශ ද්‍රෝහීන් ලෙස සලකන ලදැ"යි ඈ තව දුරටත් කීවාය. එය මාධ්‍ය ක්‍රියා කල ආකාරය මත බලපෑමක් ඇති කලේ ය. - මේ බලපෑම මාධ්‍ය භාවිතයේ දී ආක්‍රමනශීලීත්වයේ මට්ටමින් දැකගත හැකි විය.

පාලන තන්ත්‍රයෙහි බොරු ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය මත කිසිදු වරදක් පැටවිය නොහැකි බව ගිබ්සන් කියා සිටියේ ය. "එය හුදෙක්ම පාලන තන්ත්‍රයෙන් සහායට හඬ නැංවීමක් විය. ඒවා විවාදය කිරීම අපගේ කාර්යභාරය නොවේ. අපගේ කාර්යභාරය අදාල ප්‍රශ්න ඇසීමය" යි ඔහු අවධාරනය කලේ ය.

ප්‍රචාරක ක්‍රියාපටිපාටියට සීමා වන ලෙස අවධාරනය කරමින් ධවල මන්දිරය හා පෙන්ටගනය අප මාධ්‍ය මත දැවැන්ත පීඩනයක් එල්ල කලේයයි විලියම්ස් කියා සිටියේ ය. ඔහු කීවේ "එකල නැංවූ හඬ ඉතාමත් අසාමාන්‍ය එකක්" බවය.

මෙහිදී සැලකිය යුතු මට්ටමක බියවැද්දීමක් තිබුනු අතර - තීරනාත්මක ප්‍රශ්න අසන වාර්තාකරුවන්ට ප්‍රවේශවීමට බාධා කිරීමට පාලන තන්ත්‍රය තර්ජන එල්ල කල අවස්ථා විලියම්ස් හා කුරික් යන දෙදෙනාම උපුටා දැක්වූහ - යුද්ධය කරා පෙලගැස්මෙහිදී සංස්ථාමය පාලනය යටතේ පිහිටි ජනමාධ්‍ය කිසි අයුරකින් අක්‍රිය හෝ නොකැමැති සහයෝගීව කටයුතු කරන්නෙකු නොවීය.

ජනතාව ඇසීමට කැමති දෑ ඉදිරිපත් කරමින් පුවත්පත් මාධ්‍ය "දේශනුරාගී උද්වේගයට" හා "9/11හි භාවාර්ථයට" යටත් වූයේ නැත. යුද්ධයට පක්ෂ මනෝභාවය ඇවිස්සීමට සක්‍රියව උත්සුක වූයේ ද ඉතා ආසන්න ප්‍රකෝප කිරීමකින් තොරව සිදුවන ඉරාක ආක්‍රමනය හා 2001 සැප්තැම්බර් 11 වැනිදා ත්‍රස්තවාදී ප්‍රහාර ව්‍යාජ ලෙස එකට සම්බන්ධ කලේද ජන මාධ්‍යමය.

ඇත්ත වශයෙන්ම, ආක්‍රමනය කරා දිව එන කාල පරිච්ඡේදය තුල එක්සත් ජනපදයෙහි හා ලොව වටා ඉරාකයට එරෙහි යුද්ධයකට විරෝධය පෑම සඳහා මිලියන් දස ගනන් ජනකායන් වීදි බසිමින් ඉතිහාසය පුරා විශාලතම පෙලපාලි දක්නට ලැබින. වහාම යුද්ධයක් දියත් කරනු වස් ආයුධ පිරික්සීම් අවසන් කිරීමට බුෂ් පාලන තන්ත්‍රය දැරූ ආයාසයට බහුතරයක් විරුද්ධ වන බවට එවකට කරන ලද මත විමසුම්වලින් පෙනීගියේය. ආක්‍රමනය කිරීම සඳහා පාලන තන්ත්‍රය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාජයන් සම්බන්ධයෙන් පුලුල් ලෙස පැතුරුනු සංශයවාදයක් ගොඩ නැගුනි. මේ ව්‍යාජයන් වූයේ සමූලඝාතක අවි තිබීම හා සදාම් හුසේන් හා අල්කයිඩා සංවිධානය අතර තිබූ සබඳකම් පිලිබඳ චෝදනා ගැන පලල්ව පැතුරුනු සංශයක් පැවතියේ ය.

මේ මත කිසිවක් ම පාහේ ජනමාධ්‍ය තුලින් ප්‍රකාශනය නොවුනි. දැවැන්ත පෙලපාලි පිලිබඳ වාර්තා පල නොවුනු තරම්ය. මේ සංසිද්ධිය තුල එක්තරා බියගුලු කමක් තිබිනු බවට සැකයක් තිබිය නොහැක. මහ ජනතාව විසින් නොව, න්‍යාය පත්‍රය සැකසූ දේශපාලන දක්ෂිනාංශය විසින් "දේශ ද්‍රෝහීන්" ලෙස හංවඩු ගැසීම පිලිබඳ බියක් මේ තුල තිබුනි.

බඳාදා මැක්ලෙලන්ගේ කෘතිය ගැන සිය අදහස් දක්වමින් එන්බීසී ආයතනයේ වොෂිංටන් කාර්යංශයේ ප්‍රධානි ටිම් රසර්ට් සඳහන් කලේ යුද "ප්‍රචාර" හා ව්‍යාජයන් පදනම් කොට ගෙන රට යුද්ධය කරා ඇදගෙන යෑම සම්බන්ධයෙන් එම කෘතියෙන් බුෂ් පාලන තන්ත්‍රයට චෝදනා නගන ලද බවය. මේ චෝදනාව නගන ලද්දේ මූව්ඕන්.ඕර්ග් වැනි පිටස්තර කන්ඩායමක් විසින් නොව, වසර හතක් පුරා ධවල මන්දිරයෙහි සේවය කල පුද්ගලයෙකු විසිනැ"යි ඔහු ප්‍රකාශ කලේ ය.

ඒ ප්‍රභේදය කැපී පෙනෙන එකකි. යුද්ධය පිලිබඳ වමෙන් විවේචන කෙරෙන පොදු ජන මාධ්‍ය ඉවෙන් මෙන් ප්‍රතික්ෂේප කලෝය. තව දුරටත් ප්‍රතික්ෂේප කරති. මූව්ඕන්.ඕර්ග් වැනි ඩිමොක්‍රැටික් පක්ෂයට යොමුවූ බලපෑම් එල්ල කිරීමට සංවිධානය වූ කන්ඩායමක් විසින් කරන විවේචන පවා පොදු ජන මාධ්‍ය ප්‍රතික්ෂේප කලහ. මැක්ලෙලන්ගේ කෘතිය තුල නව හෙලිදරව් කිරීම් නැත. ආක්‍රමනශීලී යුද්ධයකට සූදානම් වීම සඳහා බුෂ් පාලන තන්ත්‍රය බොරු සහ ප්‍රචාර උපයෝගි කර ගත් බවට 2001 වසරෙහි සිට *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* දිගින් දිගටම වාර්තා කල හා ලේඛනගත කල කරුනකි. එනමුදු, සංස්ථාමය පාලනය යටතේ ඇති ජනමාධ්‍යවලට වමෙන් එන ඕනෑම කරුනක් මහජන මතයෙහි හෝ විවාදයෙහි සුජාත කොටසක් නොවේ.

මේ ක්‍රියාවලිය තුලවඩාත්ම අති මූලික වන්නේ දේශපාලන බියගුලුකමට වඩාසමාජ ලාභාපේක්ෂා ය. පොදු ජන මාධ්‍යවල අයිතිය මුලුමනින් ම පාහේ සතුවන්නේ දැවැන්ත ධනේශ්වර ව්‍යාපාරික සංස්ථාවන්ට ය. වයකොම් ඉන්කෝපරේටඩ් සමාගමට අයත් සීබීඑස් ආයතනය, වෝල්ට් ඩිස්නි සමාගමට අයත් ඒබීසී ආයතනය, ඒඕඑල් ටයිම් වොනර්ට අයත් සීඑන්එන් ආයතනය, ජෙනරල් ඉලෙක්ට්‍රික් සමාගමට අයත් එන්බීසී ආයතනය හා රූපට් මර්ඩොක්ට අයත් ෆොක්ස් ආයතනය - මේ සියලු ආයතන හුදෙක් ධවල මන්දිරයෙහි හා දක්ෂිනාංශයේ පීඩනයට හිස නැමුවා පමනක් නොව, යුද්ධය සක්‍රීයව ප්‍රවර්ධනය කලහ. යුද්ධය තුලින් සංස්ථාමය අයිතිකරුවන්ගේ හා ප්‍රධාන

කොටස්කරුවන්ගේ ලාභාපේක්ෂා වැඩිදියුනු කල හැකි යයි සැලකූහ. මොවුන්ගේ දේපල, ඛනිජ තෙල්, ආයුධ හා මූල්‍ය ප්‍රාග්ධනය ඇතුලු ආර්ථිකයෙහි අනිකුත් අංශවලට ද ව්‍යාප්ත වී තිබුනි.

මැක්ලෙලන්ගේ කෘතිය සම්බන්ධයෙන් "මම මුල සිට ම දැන සිටියෙමි" යන හිසින් යුතු නරුම කතුවැකියක් *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත පල කලේ ය. බුෂ් පාලන තන්ත්‍රය පිලිබඳව හිටපු පුවත්පත් ලේකම්ගේ හෙලිදරව් කිරීම් හුදෙක් ලාභදායී පොත් ගනුදෙනුවකින් අභිප්‍රේරනය වූ බව එමගින් ඉඟි කෙරුනි.

*ටයිම්ස්* පුවත්පත මෙසේ කරුනු දැක්වීය: " කෘතිය පලකිරීම ආත්මාර්ථකාමී ක්‍රියාවක් වුවද එමගින් යහපත් අරමුනක් ඉටුවේ: බුෂ් මහතා, චේනි මහතා සහ අනිකුත් අය "මුලාවේ සංස්කෘතියට" ඇතුලුවීමට කොතරම් දුරකට කැමැත්තෙන් සිටියේ ද යන්න ගැන නිශ්චිත අවබෝධයක් අප තුල නැතැයි යන්න මෙය සිහිපත් කරයි."

ඇමරිකානු ජනතාව මුලා කිරීම හා ඉරාකයට එරෙහි යුද න්‍යාය පත්‍රය දිගේලි කිරීම අරමුනු කොට මේ ව්‍යාපාරය තුල *ටයිම්ස්* පුවත කරවටක් ගිලී සිටියේය යන්න කිසිදු තැනක පිලිගෙන නැත. මෙම මෙහෙයුම තුල *ටයිම්ස්* පුවත්පත වඩාත්ම බලපෑමක් ඇති හා පිලිකුල් සහගත භූමිකාව රඟපෑවේය. ආක්‍රමනයට සූදානම් වීම සඳහා "සමූල ඝාතක අවි" සම්බන්ධයෙන් පාලන තන්ත්‍රයෙහි ව්‍යාජ චෝදනා මේ පුවත්පතෙහි දෝංකාරය වූවා පමනක් නොව, ඒවා ඔප්නැංවුනි.

මේ අතරවාරයේ, *ටයිම්ස්* පුවත්පත හා අනිකුත් ජනමාධ්‍ය කොටස් එවැනිම ආකාරයක මෙහෙයුමකට නිරතවී සිටිති. එය ඇමරිකා යුදවාදයේ තවද පිපිරීමකට මග පාදන්නකි. මෙවර එය ඉරානයට එරෙහිව ය.

මැක්ලෙලන්ගේ අභිප්‍රාය කුමක් වුව ද, කෘතිය හැඳින්වීම සඳහා යොදා ඇති "මුලා කිරීමේ සංස්කෘතිය යන ප්‍රකෝපකාරී වැකිකඩෙන් විස්තර කෙරෙන්නේ බුෂ් පාලන තන්ත්‍රයවත් වොෂිංටනයෙහි පක්ෂග්‍රාහී දේශපාලනයවත් නොවේ. එමගින් විස්තර කෙරෙන්නේ කොංග්‍රසය, ඩිමොක්‍රැටික් පක්ෂය, ජනමාධ්‍ය හා ප්‍රධාන බැංකු හා සංස්ථා ඇතුලු සමස්ත දේශපාලනමය සංස්ථාපනයයි. එය තම විදේශීය හා දේශීය ඇතුලු සමස්ත ප්‍රතිපත්තියම පදනම් කොට ගෙන ඇත්තේ ඇමරිකානු ජනතාවට ක්‍රමානුකූලව හා වඩවඩාත් ලජ්ජා නැති ආකාරයට බොරු කිරීම මතය.

සමූල ඝාතක අවි පිලිබඳ බොරු කීම මෙහෙයවන ලද්දේ යුද අභ්‍යාසයට පාදක වූ ගසාකන පන්ති අවශ්‍යතා ඇමරිකානු ජනතාවගෙන් වසන් කිරීමට ඇමරිකානු පාලක සංස්ථාපනයට ඇති අවශ්‍යතාව මගිනි. යුද්ධය කරගන යන ලද්දේ ඇමරිකානු ජනතාව "ආරක්ෂා කිරීම" අරමුනු කොට ගෙන නොව, ආක්‍රමනික යුද්ධයක මාර්ගයෙන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මුඛ්‍ය මූලෝපායික අරමුනක් සාක්ෂාත් කර ගැනීම සඳහාය. එනම්, ඛනිජ තෙල්වලින් සාරවත් වූ පර්සියානු මුහුදු බොක්ක තම ආධිපත්‍ය යටතට ගැනීම සඳහා ය.

යුද්ධය පිටුපස ඇති සැබෑ පෙලඹුම සමූල ඝාතක අවි හෝ ත්‍රස්තවාදය නොව, මැද පෙරදිගෙහි ප්‍රජාතන්ත්‍රවාදය පැතිරවීමේ බුෂ් සහ ඔහුගේ සගයන්ගේ අභිප්‍රාය බව සිය කෘතියෙහි ප්‍රකාශ කරමින් මේ බොරු කීමේ සිය භාවිතය මැක්ලෙලන් දිගටම ගෙන යන බව සටහන් කල යුතුය. ඇතැම් විට මෙය ඔහුගේ වඩාත්ම හාස්‍යමය ව්‍යාජය විය හැක.

එවැනි බොරු තුල ගැඹුරු සමාජමය මූලයන් ඇත. ඒවා අවශ්‍යතාවක් හා දේශපාලනමය ප්‍රතික්‍රියාවක් වන්නේ දේශපාලන පක්ෂ දෙක තුලින් ම නියෝජනය වන මූල්‍යමය ප්‍රභුවේ ලාභාපේක්ෂාවන් හා සමාජයේ අතිමහත් බහුතරය වන ඇමරිකානු වැඩ කරන ජනතාවගේ ලාභාපේක්ෂාවන් අතර ඇති තියුනු පරස්පර විරෝධය නිසාය.

මැක්ලෙලන්ගේ කෘතිය වටා ගෙතී ඇති මතභේදය විදහා දක්වන්නේ අපරාධකාරිත්වයට හා සමූල ඝාතනයට සම්බන්ධ වන මේ බොරු හෙලිවූ විට නියම විපාක නොලැබෙන බවයි. ඉරාකයෙහි යුද්ධය දියත් කිරීමෙහි දී බුෂ් සමග "හවුල්වූ අනුබල දෙන්නන්" වශයෙන් මැක්ලෙලන් විසින් හඳුන්වන ලද බලවේග තවමත් ක්‍රියාත්මක වෙමින් සිටිති. එමගින් තමා ධවල මන්දිරයෙන් ඉවත්ව යන අවසන් දිනය තෙක් ලේ වැගිරීම නොනවත්වා කරගෙන යාමට බුෂ්ට ඉඩ ලැබේ.

ජනමාධ්‍ය හා ඩිමොක්‍රැටික් පක්ෂය තුල අප්‍රමාන "අනුබල දෙන්නන්ගෙන්" ශක්තිමත්වූ පරිපාලනයෙහි ප්‍රචාරයන්හි සියලු ප්‍රයත්නයන් නොසලකා ඇමරිකානු ජනතාවගේ අති බහුතරය තීරනාත්මකව යුද්ධයට එරෙහි වීම අපූර්ව කරුනකි. ඔවුන් එසේ කලේ දේශපාලන සංස්ථාපනය තුලින් හෝ ජනමාධ්‍ය තුලින් යුද්ධයට එරෙහිව නැඟුනු විවේචනයට ප්‍රතිචාරයක් වශයෙන් නොව, යුද්ධය පිලිබඳවත් ඇමරිකානු ධනවාදයෙහි වඩාත් පුලුල් සමාජමය අර්බුදය පිලිබඳවත් තමන්ගේ ම අම්හිරි අත්දැකීම් පදනම් කොට ගෙන ස්වාධීනව ය.

අවසානයේ දී, බොරු කී අය හා සාපරාධී ආක්‍රමනශීලී යුද්ධයක් ක්‍රියාත්මක කල අය වගකිව යුත්තන් කිරීම රඳ පවතිනුයේ යුද්ධයට එරෙහිවත් එයට තුඩු දුන් ධනේශ්වර ක්‍රමයට එරෙහිවත් අරගලයක යෙදෙන වැඩ කරන ජනතාවගේ ස්වාධීන නව දේශපාලන ව්‍යාපාරයක් ඉස්මතු වීම මතය.

© www.wsws.org